## අම්බලන්තොට ප්‍රාදේශීය සභාව
## හම්බන්තොට දිස්ත්‍රික්කය

1 මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2017 මාර්තු 30 දිනද, ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 31 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2017 අගෝස්තු 18 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2016 දෙසැම්බර් 31 දිනට අම්බලන්තොට ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.3.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති

ගිණුම්කරණ අස්ථිත්වය පිළිබඳ තොරතුරු සහ ආයෝජන හා ආයෝජන පොලී ගිණුම් තැබීමේදී අනුගමනය කරන ලද පදනම් මූල්‍ය ප්‍රකාශන මගින් හෙළිදරව් කර නොතිබුණි.

#### 1.3.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත දැක්වෙන ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 2016 භාණ්ඩ සමීක්ෂණ වාර්තාවේ නිර්දේශ මත අපහරණය හා වෙන්දේසි කර තිබූ රු. 760,753 ක් වූ ස්ථාවර වත්කම්වල පිරිවැය මූල්‍ය ප්‍රකාශන වලින් ඉවත්කර තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුළ මිලදී ගෙන තිබුණු රු. 543,546 ක වත්කම් ප්‍රාග්ධන වත්කම් යටතේ ගිණුම්ගත කර නොතිබුණි.

(ඇ) දෙබරතුඩුව අතුරු මාර්ගය සංවර්ධනය කිරීම වෙනුවෙන් ගෙවිය යුතු රු. 55,826 ක් වෙනුවෙන් ණයහිමි ප්‍රතිපාදන ඇති කර නොතිබුණි.

(ඈ) සාමාන්‍ය ගබඩා හා විදුලි භාණ්ඩ ගබඩා තොග යටතේ ගිණුම්ගත කළයුතු රු. 96,479 ක් වූ මිලදී ගැනීම් ප්‍රාග්ධන වත්කම් වශයෙන් ගිණුම්ගත කර තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයට අදාළව ස්ථාවර තැන්පතු පොලිය රු. 2,008 ක් අඩුවෙන් සහ රාජ්‍ය සුරැකුම්පත් මත ආයෝජන පොලිය රු. 60,139 ක් වැඩියෙන් ගිණුම් ගත කර තිබූ අතර රාජ්‍ය සුරැකුම්පත් මත ආයෝජන පොලිය වැඩියෙන් ගිණුම්ගත කිරීම නිසා ආයෝජන ගිණුමේ ශේෂය රු. 60,139 ක් වැඩියෙන් දැක්වුණි.

### 1.3.3 නොසැසඳූ පාලන ගිණුම්

මූලා ප්‍රකාශන වල ඇතුළත් ගිණුම් විෂයයන් 10 ක ශේෂ සහ ඊට අදාළ පොත්පත් හා උපලේඛන වල දැක්වෙන ශේෂ අතර, එකතුව රු. 717,879 ක් වූ අසමානතා නිරීක්ෂණය විය.

### 1.3.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

**(අ) ලැබිය යුතු ගිණුම්**

i. 2009 සහ 2010 වර්ෂ වලට අදාළව නඩු පවරා තිබුණු රු. 1,737,341 ක බදු ආදායම් අයවිය යුතුව පැවතුණි.

ii. 2013 වර්ෂයේ සිට 2016 වර්ෂයේ දෙසැම්බර් 31 දක්වා කාලපරිච්ඡේදය තුළ වාහන කුලියට දීම වෙනුවෙන් රු. 1,550,229 ක මුදලක් අයවිය යුතුව තිබුණි.

iii. 2014 සහ 2016 යන වර්ෂ වෙනුවෙන් අය විය යුතුව තිබුණු සංවර්ධන ආධාර වල එකතුව රු. 646,916 ක් විය.

iv. අවස්ථා තුනකදී ලබාදී තිබුණු එකතුව රු. 59,580 ක් වූ අත්තිකාරම් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් නිරවුල් කරගෙන නොතිබුණි.

**(ආ) ගෙවිය යුතු ගිණුම්**

i. 2014 සහ 2015 යන වර්ෂ වෙනුවෙන් ගෙවිය යුතු විවිධ ණයහිමි ශේෂවල එකතුව රු. 4,320,107 ක් විය.

ii. දේශීය ණය සංවර්ධන අරමුදලට සමාලෝචිත වර්ෂය සඳහා ගෙවිය යුතු එකතුව රු. 1,084,024 ක් වූ ණය වාරික නිරවුල් කර නොතිබුණි.

iii. සමාලෝචිත වර්ෂය අවසානයට බේරුම් නොකළ බැරකම්වල මුළු එකතුව රු. 18,660,699 ක් විය.

### 1.3.5 විගණනය සඳහා සාක්ෂි නොවීම

එකතුව රු. 63,346,956 ක් වූ ඉඩම් හා ගොඩනැගිලි සම්බන්ධයෙන් යාවත්කාලීන කරන ලද ස්ථාවර වත්කම් ලේඛනය, ඉඩම් හා ගොඩනැගිලි ලේඛනය, උපලේඛන, වාර්ෂික සමීක්ෂණ මණ්ඩල වාර්තා සහ හිමිකම් ඔප්පු/පැවරුම් නියෝගද, එකතුව රු. 5,329,811 ක් වූ හිඟ වරිපනම් බදු සම්බන්ධයෙන් බදු ලේඛන හා කාල විශ්ලේෂණද, එකතුව රු. 12,763,706 ක් වූ තැන්පත් සම්බන්ධයෙන් විස්තරාත්මක උපලේඛන හා කාල විශ්ලේෂණද, එකතුව රු. 94,995 ක් වූ පුස්තකාල තැන්පත් සම්බන්ධයෙන් තැන්පත් ලේඛන, විස්තරාත්මක උපලේඛන හා කාල විශ්ලේෂණයද ඉදිරිපත් නොකෙරුණු බැවින් විගණනයේදී ඒවා සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය.

**1.3.6 නීති, රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම**

පහත විස්තර දැක්වෙන නීති, රීති හා රෙගුලාසි වලට අනුකූල නොවීමේ අවස්ථා විගණනයේදී නිරීක්ෂණය කරනු ලැබේ.

| නීති¸රීති¸රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති සංග්‍රහයේ රීති 217 හා 218 | සභාව සතු කරන ලද, සභාව විසින් ප්‍රයෝජනයට ගනු ලබන සියළුම ඉඩම් හා ගොඩනැගිලි පිළිබඳ තොරතුරු ඇතුළත් කර පී.එස්. 46 ආකෘතිය ප්‍රකාර ලේඛනය යාවත්කාලීන කිරීමට හා වාර්ෂික සමීක්ෂණයක් කිරීමට කටයුතු කර නොතිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| i. මුදල් රෙගුලාසි 396 (ඇ) | නිකුත් කළ නමුත් ගෙවීම සඳහා ඉදිරිපත් නොකළ කල් ඉකුත් වූ එකතුව රු. 15,345 ක් වූ චෙක්පත් 03 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. |
| ii. මුදල් රෙගුලාසි 571 | කල් ඉකුත් වූ රු. 756,547 ක තැන්පත් ශේෂ 18 ක් නියාදනය කිරීමට කටයුතු කර නොතිබුණි. |
| (ඇ) 2015 ඔක්තෝබර් 09 දිනැති අංක PFD/RED/2015/08 පොදු (i) දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල් -වරයාගේ චක්‍රලේඛයේ 4.3 (ආ) සහ (ඉ) වගන්ති | ණය මුදල් ගෙවා අවසන් වීමට පෙර විශ්‍රාම ගොස් සිටින නිලධාරියකුගෙන් අයවිය යුතු රු. 102,190 ක ආපදා ණය මුදල සහ සේවය අත්හිටුවන ලද, සේවයෙන් පහ කරන ලද සහ ඉවත්ව ගිය නිලධාරීන් 04 දෙනෙකුගෙන් අයවීමට තිබූ එකතුව රු. 236,269 ක් වූ ණය හා අත්තිකාරම් මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු. 21,017,438 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු. 5,607,200 ක් විය. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.15,410,238 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි.

**2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය**

**----------------------------------**

පහත දැක්වෙන නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ මුළු පුනරාවර්තන ආදායමින් සියයට 78 ක් තරම් ඉහළ අගයක පුනරාවර්තන වියදම් පැවතුණි.

(ආ) ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී ආදායම් ආධාර වල සැලකිය යුතු වර්ධනයක් මෙන්ම, ස්වයං උත්පාදන ආදායමෙහිද වර්ධනයක් දක්නට ලැබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේදී මෙන්ම ඉකුත් වර්ෂ දෙකේදීද ස්වයං උත්පාදන ආදායම් ඉක්මවා සැළකිය යුතු ඉහළ අගයන්ගෙන් පුනරාවර්තන වියදම් වැඩිවී තිබුණි.

**2.3 කාරක ප්‍රාග්ධන කළමනාකරණය**

------------------------------------

2014 වර්ෂයට සාපේක්ෂව 2015 වර්ෂයේදී සහ සමාලෝචිත වර්ෂයේදී ජංගම හා ක්ෂණික අනුපාතයන්හි සතුටුදායක තත්ත්වයක් පෙන්නුම් කෙරේ. කෙසේ වුවද, ජංගම වත්කම් ශේෂය තුළ රු. 41,752,369 ක් වූ හිඟ ණයගැති ශේෂ පැවතීමෙන් අනුපාතයන් ප්‍රකාරවම ද්‍රවශීලතා තත්ත්වයක් නොපවතින බව නිරීක්ෂණය විය.

**2.4 ආදායම් පරිපාලනය**

**--------------------**

**2.4.1 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

**-----------------------------------**

2016 දෙසැම්බර් 31 දිනට සභාවේ ආදායම් රැස්කිරීමේ ප්‍රගතිය පිළිබඳව පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය සඳහා බිල් කළ ආදායම රු. මිලියන 45.85 ක් වූ අතර, ඉන් රු. මිලියන 25.78 ක් රැස්කර තිබුණි. ඒ අනුව ආදායම් රැස් කිරීමේ ප්‍රගතිය සියයට 56 ක් විය.

(ආ) සමාලෝචිත වර්ෂය ආරම්භයට ලැබිය යුතු ආදායම් ශේෂවල එකතුව රු. මිලියන 20.83 ක් වූ අතර, ඉන් රු. මිලියන 9.75 ක් අයවී තිබුණි. ඒ අනුව හිඟ ආදායම් අය කිරීමේ ප්‍රගතිය සියයට 47 ක් විය.

**2.4.2 වරිපනම්**

**---------**

ආරම්භක හිඟය රු. 5,440,227 ක් වූ අතර, රු. 3,496,717 ක් වූ බිල් කිරීම් සමඟ රු. 8,936,944 ක් අයවිය යුතුව තිබුණි. සභාවේ කාර්ය මණ්ඩලයේ සිටින ආදායම් පරීක්ෂකවරුන් තිදෙනාට අමතරව වෙනත් නිලධාරියෙකු ද ආදායම් පරීක්ෂක තනතුරේ රාජකාරී ඉටු කිරීම සඳහා යොදවා තිබියදීත්, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158 (1) (අ) වගන්තිය ප්‍රකාරව හිඟ වරිපනම් අයකර ගැනීම සඳහා විධිමත් ක්‍රියාමාර්ග නොගැනීම නිසා බිල් කිරීම් වලින් සියයට 42 ක් හා ආරම්භක හිඟයෙන් සියයට 39 ක් අයවී තිබුණි.

**2.4.3 බදු කුලී**

---------

2010 දෙසැම්බර් 27 දිනැති අංක දපපා/පපාකො/2010/01 දරන දකුණු පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛයේ අංක 06 ඡේදයට අනුකූලව කඩ කාමර වසර පහකට වරක් තක්සේරු කර බදු කුලිය සංශෝධනය කළයුතු අතර, උක්ත චක්‍රලේඛයේ අංක 05 ඡේදය අනුව කඩ කාමර සඳහා වන ගිවිසුම් සෑම වසර තුනකට වරක්ම යාවත්කාලීන කළයුතුය. එහෙත් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් එකී උපදෙස් අනුව කටයුතු කර නොතිබුණි.

**2.4.4 බලපත්‍ර ගාස්තු**

---------------

සමාලෝචිත වර්ෂය අවසානයට හිඟ බලපත්‍ර ගාස්තුව රු. 73,800 ක් වූ අතර, එම හිඟයෙන් රු. 70,800 ක් ඉකුත් වර්ෂවලට අදාළ ඒවා විය. එම හිඟ ගාස්තු අයකර ගැනීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149,150 හා 152 යන වගන්ති ප්‍රකාර කටයුතු කර නොතිබුණි.

**2.4.5 වෙනත් ආදායම්**

-------------------

සභාවට අයත් යන්ත්‍රෝපකරණ කුලී පදනම මත ලබාදීම වෙනුවෙන් 2016 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු මුළු ආදායම රු. 1,042,128 ක් වූ අතර, එම හිඟය අයකර ගැනීම සඳහා විධිමත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. මෙම හිඟ ආදායමට 2013, 2014 හා 2015 යන වර්ෂ වලට අදාළ රු. 954,128 ක ශේෂ ඇතුළත්ව තිබුණි.

**2.4.6 දැන්වීම් පුවරු ගාස්තු ආදායම්**

--------------------------------

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 126 (XXX) වගන්තිය ප්‍රකාරව බල ප්‍රදේශය තුළ සවිකර ඇති දැන්වීම් පුවරුවලින් ගාස්තු අයකර නොගැනීම නිසා සමාලෝචිත වර්ෂය අවසානයට අයවිය යුතු හිඟ දැන්වීම් පුවරු ගාස්තු ආදායම රු. 222,300 ක් විය.

**2.4.7 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

------------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2016 දෙසැම්බර් 31 දිනට උසාවි දඩ වෙනුවෙන් රු. 7,468,958 ක් හා මුද්දර ගාස්තු වෙනුවෙන් රු. 8,647,000 ක් ලැබිය යුතුව තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

--------------------------

**3.1 නිෂ්ක්‍රීය හා ඌණ උපයෝජිත වත්කම්**

----------------------------------------

නළ ළිං හා ජල ව්‍යාපෘති වලට අදාළ එකතුව රු. 100,294 ක් වූ තොග ප්‍රයෝජනයට නොගෙන 2004 හා 2008 යන වර්ෂවල සිට නිෂ්ක්‍රීයව පැවතුණි.

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

**-----------------------------------**

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) අම්බලන්තොට සතිපොළ 2016 වර්ෂය සඳහා රු. 6,651,300 කට බදුදීම වෙනුවෙන් 2015 දෙසැම්බර් 18 දින ගිවිසුම් අත්සන් කර තිබුණි. බදුකරු විසින් ගිවිසුම් ප්‍රකාරව බදු නොගෙවීම නිසා 2016 මැයි 31 දින එම බදු ගිවිසුම අවලංගු කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(i) 2016 මැයි 23 දින වෙනත් බදුකරුවකු විසින් රු. 2,345,000 කට පොළ බදු එකතු කිරීමේ අයිතිය ඉල්ලා තිබුණු බැවින්, 2016 මැයි 27 දින ඔහු සමඟ ගිවිසුමකට එළඹී තිබුණි.

(ii) පළමු බදුකරු මෙන් දෙවන බදුකරුද ගිවිසුම් ප්‍රකාරව මාසික බදු මුදල් ගෙවා නොතිබූ අතර, බදුකරුවන් දෙදෙනාගෙන් රු. 1,282,436 ක ප්‍රමාද දඩ මුදලක්ද, 2016 ජුනි සිට දෙසැම්බර් දක්වා ලංසු මුදල අඩුවීම වෙනුවෙන් රු. 455,000 ක්ද ඇතුළුව රු. 1,737,436 ක මුදලක් සභා අරමුදලට අහිමි වී තිබුණි.

(ආ) භාණ්ඩ ඌණතා

------------------

2016 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව භාණ්ඩ ඒකක 15 ක ඌණතාවයක් අනාවරණය වී තිබුණු නමුත්, ඊට වගකිව යුතු නිලධාරීන් හඳුනාගෙන ඔවුන් වෙත වගකීම් පවරා ඒවායේ වටිනාකම් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**3.3 ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය**

**---------------------------------**

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) කසල බැහැර කිරීම කරන හා කොම්පෝස්ට් අංගනය පවත්වාගෙන යන ඉඩම සභාව වෙත පවරා ගෙන නොතිබුණි.

(ආ) සමස්ථ බල ප්‍රදේශය ආවරණය වන පරිදි කසල කළමනාකරණය කර නොතිබුණු අතර, කසල බදු පනවා වියදම් ආවරණය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**3.4 වාහන පාලනය**

**-----------------**

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) රාජ්‍ය ආයතන හා පෞද්ගලික ආයතන වලින් 1993 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා සභාව වෙත ලැබී තිබූ වාහන 04 ක අයිතිය පවරා ගැනීමට 2017 මැයි 19 දින වන විටත් කටයුතු කර නොතිබුණි.

(ආ) 2012 වර්ෂයේ සිට එක් වාහනයක්ද 2014 වර්ෂයේ සිට තවත් වාහන 03 ක්ද, නිෂ්ක්‍රීය තත්ත්වයේ පවතින නමුත්, එම වාහන සම්බන්ධයෙන් අංක 02/2015 හා 2015 ජුලි 10 දිනැති මුදල් අමාත්‍යාංශ චක්‍රලේඛයට අනුකූලව අලුත්වැඩියා කර භාවිතයට ගැනීමට හෝ අපහරණය කිරීමට හෝ කටයුතු කර නොතිබුණි.

**3.5 කාර්ය මණ්ඩල පරිපාලනය**

**-----------------------------**

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අනුමත කාර්ය මණ්ඩලයට අයත් තනතුරු වල සේවකයන් දෙදෙනෙකු ඇතුළුව 07 දෙනෙකුගේ අතිරික්තයක් සහ තනතුරු 05 ක 08 දෙනෙකුගේ පුරප්පාඩු පැවතුණි. අතිරික්ත තනතුරු විධිමත් කර ගැනීමට මෙන්ම පුරප්පාඩු පුරවා ගැනීමට සභාව විසින් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

**4. යහපාලනය හා ගිණුම් කටයුතුභාවය**

**-------------------------------------**

**4.1 අයවැය පාලනය**

**-----------------**

සමාලෝචිත වර්ෂය සඳහා වූ අයවැය ලේඛනයේ ඇතුළත් වියදම් විෂයයන් 26 ක එකතුව රු. 45,698,500 ක ප්‍රතිපාදන සම්පූර්ණයෙන්ම ඉතිරි කර තිබූ අතර, වියදම් විෂයයන් 159 ක එකතුව රු. 87,550,365 ක ඉතිරි කිරීම්ද, ආදායම් විෂයයන් 05 ක ළගා කර නොගත් රු. 72,462,000 ක ඉලක්කයන්ද පැවතීම නිසා අයවැය ලේඛනය ඵලදායි කළමනාකරණ පාලන කාරකයක් වශයෙන් යොදා ගෙන නොතිබුණි.

**4.2 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම**

**-------------------------------**

සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රාදේශීය සභාව විසින් ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

**4.3 විගණන හා කළමනාකරණ කමිටු ක්‍රියාත්මක වීම**

-----------------------------------------------------

2009 ජුනි 09 දිනැති අංක DMA/2009 (1) දරන කළමනාකරණ විගණන චක්‍රලේඛය ප්‍රකාරව විගණන හා කළමනාකරණ කමිටුවක් ස්ථාපිත කිරීමට සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් කටයුතු කර නොතිබුණි.

**5. පද්ධති හා පාලන**

**------------------**

පහත දැක්වෙන පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු විය යුතුය.

(අ) ගිණුම්කරණය

(ආ) ආදායම් පරිපාලනය

(ඇ) ස්ථාවර වත්කම් පාලනය

(ඈ) අයවැය පාලනය